## ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙහි විද්‍යාත්මක පර්යේෂණ නිලධාරී තනතුරට කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමේ පටිපාටිය.

01) සම්බන්ධ වන ආයතනය

1.1 දෙපාර්තමේන්තුව : ආණ්ඩුවේ රස පරීක්ෂක

යොමු අංකය : GAD/AD/03/Sc.RO/2025/50 දිනය : 2026.01.27

1.2 අමාත්‍යාංශය : අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා

යොමු අංකය : MOJ/E08(II)/GAD/S.R.O. දිනය : 2026.01.30

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම.

යොමු අංකය : DMS/CAD/GAD/CM දිනය : 2026.01.16

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය

යොමු අංකය : EST-2/07/REC/12916 දිනය : 2026.01.20

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/05-01-32/01/2025 දිනය : 2026.02.05

02) පත්කිරීමේ බලධරයා පිළිබඳ විස්තර :

2.1 කොන්ත්‍රාත් පදනම මත පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව (2026.02.01 සිට 2027.01.31 දක්වා)

03) පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ට සහාය වීම.

04) තනතුරෙහි/ තනතුරු වල ස්වභාවය :

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ 2026.02.01 -2027.01.31 දක්වා වූ එක් වර්ෂයක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණි.

සටහන - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.

05) මාසික දීමනාව

<u>විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි</u>

මාසික දීමනාව - රු. 74,438/-

ජීවන වියදම් දීමනාව - රු. 17,800/-

06) කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු නාම, තනතුරු සංඛ්‍යාව හා එම තනතුරුවලට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| විද්‍යාත්මක පර්යේෂණ නිලධාරී (කොන්ත්‍රාත්) | 50 | නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු කඩිනම් කිරීම සඳහා විද්‍යාගාර පරීක්ෂණ කටයුතු සහ පරීක්ෂණ වාර්තා පිළියෙල කිරීමට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සහය වීමේ කාර්යයන්. |

07) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම්

| | |
|---|---|
| 7.1 අධ්‍යාපන සුදුසුකම් | -විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br><br>හෝ<br><br>1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් සහිත විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම. |
| 7.2 වෘත්තීය සුදුසුකම් | - අදාළ නොවේ. |
| 7.3 පළපුරුද්ද | - අදාළ නොවේ. |
| 7.4 කායික සුදුසුකම් | - සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. |
| 7.5 වෙනත් | - |

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.1 සිට 8.2 දක්වා සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08) වයස

| | |
|---|---|
| 8.1 අවම සීමාව | - වයස අවුරුදු 21 ට නොඅඩු. |
| 8.2 උපරිම සීමාව | - වයස අවුරුදු 40 ට නොවැඩි. |

| | |
|---|---|
| 09) බඳවා ගැනීමේ ක්‍රමය | - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

9.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: (ඇමුණුම 01)

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තොරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| 2 | ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද | 60 | |
| 3 | ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ නිබන්ධන | 10 | |
| 4 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

සටහන

I බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමානය ඇතුලත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලැබේ.

II ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

9.1.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන නිලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

9.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු

බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම.

9.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන නිලධාරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

9.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය -

රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම

10) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි: අදාළ නොවේ.

11) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ: අදාළ නොවේ.

12) සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

13) මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ :අත්සන- ........................
(විෂය භාර නිලධාරියා)
තනතුර - කා.සේ.නි III
දිනය - 2026.02.09

පරීක්ෂා කළේ: අත්සන-........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
තනතුර -...............................
දිනය - 2026/02/09

ඩබ්.ඩී.එම්. කුමුදුනී
අධ්‍යක්ෂ (පරීක්ෂණ)
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො. 31, ඉසුරු මාවත, පැලවත්ත,
බත්තරමුල්ල.

**නිර්දේශ කර ඉදිරිපත් කරමි.**
අත්සන-................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම-................................
තනතුර-..............................
නිලමුද්‍රාව -...........................

ආණ්ඩුවේ රස පරීක්ෂක
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො. 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල.

---

14) අමාත්‍යාංශ නිර්දේශය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026.02.05 දින අනුමත කරන ලද ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත් පදනම) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන:..............................
නම:....................................
ලේකම්..........................................
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.
නිල මුද්‍රාව:..............................

දිනය: 17/2/2026

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

15) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරි (කොන්ත්‍රාත් පදනම) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය , රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ......2026.02.05...... දින අනුමත කරන ලදී.

අත්සන:.......[signature].......

නම:.....ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න.....

ලේකම්:..............................

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

දිනය:.....2026.02.20.....

නිල මුද්‍රාව.........................

[stamp:] ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඇමුණුම 01

**ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක පර්යේෂණ නිලධාරී තනතුර (කොන්ත්‍රාත්) සඳහා බඳවා ගැනීමට අදාල විස්තරාත්මක ලකුණු පටිපාටිය**

| අනු අංක | ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>(I) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ<br>ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ<br>1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ සඳහන් රසායන විද්‍යා, විද්‍යාවේදී විශේෂ උපාධියක් (සිව් අවුරුදු) ලබා තිබීම.<br>• පළමු පෙළ සාමාර්ථය - 10<br>• දෙවන පෙළ ඉහළ සාමාර්ථය - 8<br>• දෙවන පෙළ පහළ සාමාර්ථය - 5<br>(උපරිම ලකුණු 10)<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විදේශීය හෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ සඳහන් රසායන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙස හදාරන ලද විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>• පළමු පෙළ සාමාර්ථය - 8<br>• දෙවන පෙළ ඉහළ සාමාර්ථය - 5<br>• දෙවන පෙළ පහළ සාමාර්ථය - 3<br>(උපරිම ලකුණු 8)<br><br>(II) ක්ෂේත්‍රයට අදාලව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ<br>ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ<br>1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ සඳහන් රසායන විද්‍යාව පිළිබඳ<br>• පශ්චාත් උපාධියක් සඳහා ලකුණු - 15<br>• පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා ලකුණු - 10<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දේ. උපරිම ලකුණු 15) | **25** | |
| 02. | **ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද**<br>I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රාජ්‍ය විශ්ව විද්‍යාලයක හෝ<br>ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්ව විද්‍යාලයක හෝ | | |

nd

| | | | |
|---|---|---|---|
| | 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ වන ආයතනයක හෝ ශිල්ප ප්‍රදර්ශක (Demonstrator) ලෙස පළපුරුද්ද.<br>• වසරකට - 10<br>• මාස 06ට වැඩි - 08<br>• මාස 03ට වැඩි - 05<br>• මාස 03ට අඩු ලකුණු ලබා නොදේ.<br>(I ට අදාලව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 30 ක් වේ.)<br><br>II. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීම.<br>• වසරකට - 20<br>• මාස 06 ට වැඩි - 15<br>• මාස 03 ට වැඩි - 12<br>• මාස 03 ට අඩු - 06<br>(II ට අදාලව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 20 ක් වේ.)<br><br>III. රජයේ හෝ පෞද්ගලික ආයතනවල රසායනාගාර විද්‍යාගාරවල පර්යේෂණ නිලධාරි, රසායනාගාර සහකාර ලෙස<br>• වසරකට ලකුණු - 10<br>• මාස 06 ට වැඩි ලකුණු - 08<br>• මාස 03 ට වැඩි ලකුණු - 05<br>• මාස 03 ට අඩු ලකුණු ලබා නොදේ.<br>(III ට අදාලව ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 10 ක් වේ.) | **60** | |
| 03. | පර්යේෂණ නිබන්ධන<br><br>I. දේශීය විදේශීය වශයෙන් ක්ෂේත්‍රයට අදාල පරියේෂණ කටයුතුවල නිරත වී පරියේෂණ වාර්තා ඉදිරිපත් කර තිබීම.<br><br>(පර්යේෂණ නිබන්ධන/වාර්තා 02 ක් සඳහා පමණක් ලකුණු ලබා දේ. උපාධිය පශ්චාත් උපාධියට අදාලව සිදු කල පරියේෂණ නිබන්ධන සඳහා ලකුණු ලබා නොදේ.) | 10 | |
| 04. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>i. සන්නිවේදන හැකියාව - 05<br>ii. පෞරුෂත්වය - 05 | **05** | |
| | **එකතුව** | **100** | |

ඉහත සඳහන් සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත එම සහතික වල මුල් පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.